**කර්මාන්ත අමාත්‍යාංශය**

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

# තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. වෛද්‍ය නිලධාරී (Medical Officer)

**(කළමනාකාර සේවා ගණය MM-1-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 01**

**බාහිර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

**අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබාගත යුතුය.

01. එම්.බී.බී.එස්. උපාධිය සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම.

**හෝ**

02. ආර්.එම්.පී. හෝ සමාන සුදුසුකම් සමග වෛද්‍යවරයෙකු ලෙස පිළිගත් ආයතනයක පශ්චාත් යෝග්‍යතා වසරක (01) පළපුරුද්ද

**සමග**

වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස සේවය කිරීමට හැකිවන ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

**MM-1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව.

**වැටුප් කේත අංකය :** MM-1-1 රු. 53,175/- - 1,375x10 - 1,910x15 = 95,575/-

**වයස් සීමාව :** අවුරුදු 22 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 02. හෙදි නිලධාරී

**(කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය MA-2-1)**

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු 01**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ

II. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) (විද්‍යා විෂය ධාරාවෙන්) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම

**සහ**

**නිපුණතා / ප්‍රවීනතා**

රජය විසින් පිළිගත් ආයතනයකින් හෙදි පුහුණුවට අදාළව ලබාගත් සහතිකයක් සමග හෙදියක් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම සහ පුහුණුවෙන් පසුව රජය විසින් පිළිගත් ආරෝග්‍යශාලාවක ලැබූ අවුරුදු එකක (01) ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**MA-2-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය :** MA-2-1 රු. 30,310/- 300x10, 350x7 - 495x4 - 660x20 = 50,940/-

**වයස් සීමාව :** අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

ගෙවනු ලබන වැටුපට අමතරව පහත සඳහන් දීමනා හා ප්‍රතිලාභ ඉහත තනතුරු සියල්ල සඳහාම හිමිවේ.

**දීමනා :**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7.800/- ක් වන ජීවන වියදම් දීමනාව.

02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.

03. මාසික පැමිණීමේ දිරි දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.

04. මසකට රු. 4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)

**ප්‍රතිලාභ :**

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව

02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)

03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය

i. වසරක් සඳහා හා රු. 200,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)

ii. වසරක් සඳහා රු. 20,000/- ක බාහිර ප්‍රතිකාර බලපත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)

iii. වසරක් සඳහා රු. 5,000/- දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)

04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබා දීම.

i. වසර දෙකකට වරක් රු. 12,000/- ක දීමනාව (විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්නාඩි හා ශ්‍රවණාදර වියදම්)

05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.

06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද, සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

01. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

02. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

03. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

04. තෝරාගනු ලබන අයදුම්කරුගේ මුළු ඉපයීම් වලින් උපයන විට ගෙවීමේ බද්ද (Pay as You Earn Paye Tex) අය කරගනු ලැබේ.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත්‍ර සමග අදාළ දෙපාර්තමේන්තුවල / ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා වන අයදුම්පත් (අදාළ සහතික පත්‍ර වල ඡායාස්ථ පිටපත්ද සමග) ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිළිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2021 අගෝස්තු 16 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුවේ.

**සභාපති,**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක 341/21, සරණ මාවත,**
**රාජගිරිය.**